විවරණිකා-2025/26-01

සංදේශය
SANDESHAYA

ලංකා බැංකු විශ්‍රාමිකයන්ගේ සංගමයේ පුවත්
NEWS OF BOC PENSIONERS' ASSOCIATION

## 45වන සංවස්තර මහා සභාව සාර්ථකව පවත්වයි!

ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ 45වන සංවත්සර මහා සභාව 2025 අප්‍රේල් 26වනදා කොළඹ කොටුවේ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටල් පරිශ්‍රයේදී මහත් උත්කර්ෂවත් අන්දමින් පවත්වන ලදී.

සංගම් ව්‍යවස්ථාවට අනුව දිවයින පුරා විසිරී සිටින නව දහසක් ඉක්මවු මහා සාමාජිකත්වය නියෝජනය කරමින් පත්කෙරුණු 459 දෙනෙකුගෙන් යුතු නියෝජිත මණ්ඩලය සංවත්සර මහා සභාව සඳහා සහභාගීවීමට ඇරයුම් ලබා සිටි අතර ඉන් නියෝජිතයන් 360 දෙනෙකු සංවත්සර මහා සභාවට පැමිණ සහභාගීවිය. නියෝජිතයින් සිව් දෙනෙකු සහභාගී නොවීමට අවසර ඉල්ලා තිබු අතර නොදන්වා නොපැමිණි සංඛ්‍යාව අනු පස් දෙනෙකි. නියෝජිතයන්ගේ පැමිණීමත් සමග උදේ 9.30ට සංගමයේ සභාපති නිහාල් ගමගේ මහතාගේ ප්‍රධානත්වයෙන් යුතු නිලධාරි මණ්ඩලය ප්‍රධාන පීඨිකාවේ අසුන් ගැනීමෙන් සභාවේ කටයුතු ආරම්භ කෙරිනි.

සම්ප්‍රදායික පොල්තෙල් පහන දැල්වීමෙන් හා ජාතික ගීය, බැංකු ගීය හා ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ ගීය ගායනා කිරීමෙන් ඇරඹි එදිනට නියමිතව තිබු සංවත්සර මහා සභාවේ කටයුතු මධ්‍යාහ්නය වෙද්දී සාර්ථකව නිම කිරීමට හැකිවු බව සතුටින් නිවේදනය කර සිටිමු.

2025/04/26 පැවැති සංවත්සර මහා සභාවේදී පහත දැක්වෙන නිලධාරි මණ්ඩලය 2025/26 වර්ෂය සඳහා ව්‍යවස්ථානුකූලව තෝරා පත්කර ගන්නා ලදී.

| තනතුර<br>**பதவி**<br>**Position** | නම<br>**பெயர்**<br>**Name** | දුරකථන අංකය<br>**தொலைபேசி எண்**<br>**Contact No** |
|---|---|---|
| සභාපති<br>தலைவர்<br>President | කේ. ජිනදාස ගමගේ මහතා ( P. 038037)<br>திரு.கே.ஜினதாச கமகே<br>Mr. K. Jinadasa Gamage | 077-7554786/2857229<br>kgamagej@gmail.com |
| ආසන්නතම හිටපු සභාපති (නිල බලයෙන්)<br>முன்னாள் உடனடித் தலைவர் (பதவியின் காரணமாக)<br>Immediate Past President (Ex Officio) | .නිහාල් ගමගේ මහතා (P. 124935)<br>திரு.எச்·ஜி·நிஹால்<br>Mr.H. Nihal Gamage | 0777-864237<br>nihal.gamage@gmail.com |
| ප්‍රධාන ලේකම්<br>பொதுச் செயலாளர்<br>General Secretary | වී.රාජේන්ද්‍රන් මහතා (P. 027808)<br>திரு.வே.ராஜேந்திரன்<br>Mr. V. Rajendran | 077-3114478<br>jenram999@gmail.com |
| භාණ්ඩාගාරික<br>பொருளாளர்<br>Treasurer | එච්.එල්.එස්. සිල්වා (ලලිත සුනිල්) මහතා (P.040131)<br>திரு.எச்·எல்·எஸ்·சில்வா (லலித)<br>Mr. H.L.S.Silva (Lalitha Sunil) | 071-8070087<br>lalithsilva52@yahoo.com |
| උප සභාපති<br>உதவித் தலைவர்கள்<br>Vice President | එච්.එන්.කේ. ලලිත් හේමසිරි මහතා (P. 029216)<br>திரு. எச்.என்.கே.எல். ஹேமசிறி (லலித்)<br>Mr. H.N.K.Lalith Hemasiri | 077-3308968<br>hemasiri@yahoo.com |
| | ජී.ජී.ඩී.ගාමිණි ද සිල්වා මහතා (P.042581)<br>திரு. ஜி.ஜி.டி.ஜி. டி சில்வா<br>Mr. G.G.D.Gamini de Silva | 081-2389046/077-2904611<br>gaminidslv36@gmail.com |
| | එන්.එම්.ආර්.එන්. (රංජිත්) තිලකරත්න මහතා (P.125038)<br>திரு. என்.எம்.ஆர்.என்.திலகரத்ன<br>Mr. N.M.R.N. (Ranjith) Thilakarathne | 076-2904999<br>ranjiththilakarathne1954@gmail.com |
| උප ලේකම්<br>உதவித் செயலாளர்<br>Assistant Secretary | එම්.එස්.ඒ. (ලාල්) රොද්‍රිගෝ මහතා (P.021543)<br>திரு.எம்.எஸ்.ஏ.ரொட்ரிகோ<br>Mr. M.S.A. (Lal) Rodrigo | 071-4721716/011-2781557<br>lal.rodrigo@gmail.com |

| | | |
|---|---|---|
| උප ලේකම්<br>உதவித் செயலாளர்<br>Assistant Secretary | එස්.ශ්‍රීලාල් පෙරේරා මහතා (P.096001)<br>திரு. எஸ்.எஸ்.பெரேரா<br>Mr.S.Srilal Perera | 071-4434670<br>sarathsrilalperera@gmail.com |
| උප භාණ්ඩාගාරික<br>உதவித் பொருளாளர்<br>Assistant Treasurer | ඒ.ජී. තක්සල මහතා (P.038948)<br>திரு. ஏ.ஜி. தக்சலா<br>Mr A.G. Thaksala | 0773-577383<br>ag.thaksala@gmail.com |
| කමිටුව<br>செயற்குழு<br>Committee | පී.වීරසිංහ මහතා (P.037578)<br>திரு. பி. வீரசிங்க<br>Mr P. Weerasinghe | 071-8043047/2292014<br>donpweerasinghe@gmail.com |
| | ඊ.ජී.වී.එස්.ද සිල්වා මහතා (P.061755)<br>திரு. இ.ஜி.வி.எஸ். டி சில்வா<br>Mr.E.G.V.S.de Silva | 077-3717062<br>shiranthade4@gmail.com |
| | ඒ.ඩී.කේ.ගුරුගේ මහතා (P.061844)<br>திரு. ஏ.டி.கே. குருகே<br>Mr A.D.K. Guruge | 077-9515050/2727930 |
| | ඒ.චන්ද්‍රපාල මහතා (P.069559)<br>திரு.ஏ.சந்திரபால<br>Mr.A.Chandrapala | 071-4201307/0342262713<br>athu.chandrapala@gmail.com |
| | කිව්.පතිරනගේ මහතා (P.075665)<br>திரு.கிவ்.பத்திரனகே<br>Mr Q. Pathiranage | 077-5592063/2842776<br>pathiranageq@gmail.com |
| | එච්.කේ.ඩී.හේමන්ත මහතා (P.094211)<br>திரு. எச்.கே.டி. ஹேமந்தா<br>Mr H.K.D. Hemantha | 077-1696808<br>amarasekerahemantha@gmail.com |
| | බන්දුල අබේසේකර මහතා (මාතලේ) (P.026713)<br>திரு. பந்துல அபேசேகர (மாத்தளை)<br>Mr Bandula Abeysekera(Matale) | 077-0301078 |
| | එච්.එම්.මුදියන්සේ මහතා (පුත්තලම) (P.036962)<br>திரு.எச்.எம்.முதியான்ச (புத்தளம்)<br>Mr H.M. Mudiyanse (Puttalam | 077-3823962 |
| | ටී.එම්.තිලකරත්න මහතා (කුරුණෑගල) (P.038744)<br>திரு. டி.எம்.திலகரத்ன (குருநாகல்)<br>Mr T.M. Thilakarathne(Kurunegala ) | 076-1589459/0372225024<br>tmtilakarathne@gmail.com |
| | පී.වී.ලීලාරත්න මහතා (ගාල්ල) (P.059156)<br>திரு. பி.வி. லீலாரத்ன (காலி)<br>Mr P.V. Leelaratne(Galle) | 077-7044427 |
| | පී.ඩී.එස්.ලියනගේ මහත (කෑගල්ල) (P.097201)<br>திரு.பி.டி.எஸ். லியனகே (கேகாலை)<br>Mr P.D.S. Liyanage (Kegalle) | 071-8241175<br>liyanage330@gmail.com |
| | ඒ.එස්.ඒ.වික්‍රමසිංහ මහතා (අනුරාධපුර) (P.128599)<br>திரு.ஏ.எஸ்.ஏ.விக்கிரமசிங்க (அனுராதபுரம்)<br>Mr.A.S.A.Wickremasinghe(Anuradhapura) | 071-8106450<br>sarath1960w@gmail.com |
| නිරීක්ෂකයින්<br>அவதானிகள்<br>Observers | ඩී.එන්.ජේ. දිසානායක මහතා (මාතර) (P. 027816)<br>திரு. டி.என்.ஜே. திசாநாயக்க (மாத்தறை)<br>Mr D.N.J. Dissanayake (Matara) | 071-8170011<br>dnjdissanayake@gmail.com |
| | ගුණපාල ජාගොඩ මහතා (බදුල්ල) (P.062963)<br>திரு. குணபால ஜாகொட (பதுளை)<br>Mr Gunapala Jagoda (Badulla) | 071-8606333 |
| | ආර්. රවින්ද්‍රන් මහතා ( උතුරු සහ නැගෙනහිර) (P.119419)<br>திரு.ஆர். ரவீந்திரன் (வடக்கு மற்றும் கிழக்கு காணங்கள்)<br>Mr R. Ravindran (North & East) | 077-6006511<br>ravindran57@gmail.com |
| නිල බලයෙන් පත්වී ඇති-<br>මරණාධාර සංගමයේ<br>නියෝජිතයින්<br>பதவியின் காரணமாக-<br>மரணாதர நிதியம்<br>Ex Officio- Death Donation Fund | එම්.එෆ්.එස්.ඩබ්.ස්ටෙම්බෝ මහතා (සභාපති)<br>திரு.எம்.எஃப்.எஸ்.டபிள்யூ.ஸ்டெம்போ (தலைவர்)<br>Mr.M.F.S.W.Stembo (President) (P.036247) | 077-7226751<br>sarthstembo12@gmail.com |
| | එච්.එම්.අබේසේකර මහතා (ලේකම්) (P.078388)<br>திரு.எச்.எம். அபேசேகர (செயலாளர்)<br>Mr H.M. Abeysekera(Secretary) | 071-2761720<br>rekhaabey@gmail.com |
| | කේ.එම්.කේ.එම්.ප්‍රනාන්දු මහත්මිය (භාණ්ඩාගාරික)<br>திருமதி. கே.எம்.கே.எம். பெர்னாண்டோ (பொருளாளர்)<br>Mrs.K.M.K.M.Fernando (Treasurer) (P.057730) | 077-4808686<br>kalyanifernando8@gmail.com |

2025/26 වසර සඳහා සංගමයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා බී.එම්.ප්‍රේමරත්න මහතාත් බාහිර විගණක වශයෙන් වී ඇසෝසියේට් වරලත් ගණකාධිකරන ආයතනයත් තෝරාපත්කර ගන්නා ලදී.

**කළමනාකරණ කමිටුව රැස්වේ.**

2025/26 වසර සඳහා තෝරා ගැනුනු කළමනාකරණ කමිටුවේ ප්‍රථම රැස්වීම 2025 මැයි මස 28 වන දින කොළඹ ලංකා බැංකු නගර කාර්යාලයේ පිහිටි සංගම් කාර්යාලයේදී පවත්වන්නට යෙදුනි. එහිදී මතු දැක්වෙන අනු කමිටු තෝරාපත්කරගන්නා ලද අතර නව වසර සඳහා වන සංගමයේ ක්‍රියාකාරී සැලැස්ම එකී අනු කමිටුවල යෝජනා මත පදනම්වෙමින් සකස්කිරීමටද තීරණය විය.

The inaugural meeting of the management committee for the year 2025/26 was held on 28th May 2025. At this meeting below mentioned sub committees were appointed and the road map of the association for the ensuring year will be finalized considering the proposals of those committees.

| Name of the Sub-Committee | Term of Reference | Members |
|---|---|---|
| **1.Planning and Negotiations** | Collection of Data to compile proposals to increase benefits under Superannuation Scheme including medical, pension and resolving anomalies. Follow up action on Resolutions adopted at AGM. creating consensus among COM, and membership on position to be taken at Superannuation fund management Meetings | M/s. M.F.S.W. Stembo – **Convenor**<br>G.G.D.G.S.de Silva – H.G. Nihal<br>Lalith Hemasiri - P.D.S. Liyanage –<br>H.M. Mudiyanse,- Q. Pathiranage<br>M.A.S. Rodrigo - |
| **2.Constitution Amendments** | Finalizing the proposed amendments and placing before the consultative committee/ and the proposed special AGM. | M/s M.A.S. Rodrigo -**Convenor**<br>D.N.J. Dissanayake -Lalith Hemasiri -<br>M.F.S.W. Stembo |
| **3. S.R.F.- Operations** | Check and approve SRF claims expeditiously. Recommend improvements to sub -Committee on Welfare, and COM. | M/s S. S.Perera -**Convenor**<br>A. Chandrapala -- Sriyantha de Silva<br>A.D.K. Guruge - H.K.D.Hemantha<br>N.M.R.N. Thilakarathne |
| **4. Bulletin/News Letter** | Prepare, publish and distribute Bulletins to members on a regular basis. | M/s P. Weerasinghe – **Convenor**<br>Bandula Abeysekera-Lalith Hemasiri<br>M.A.S. Rodrigo -N.M.R.N. Thilakarathne |
| **5.Digital Media** | Create awareness amongst members of our WEB.<br>Update and publish news expeditiously to create uses interest on browsing the Web-Site, improve WhatsApp communication among members | M/s H.L.S. Silva Silva – **Convenor**<br>N.K.Dahanayake- Invitee<br>Jagath Kurundukumara- Invitee<br>B.M. Premarathne-Invitee |
| **6. Finance/Investments and Audit** | Manage association's funds for optimum yield Streamline preparation of accounts. Monitor district accounts leasing with district committees.<br>Optimum yield.<br>Streamline accounting.<br>Monitor District Accounts | M/s. M.F.S.W. Stembo – **Convenor**<br>N.K. Dahanayake - Invitee<br>M.A.S. Rodrigo, H.L.S. Silva –<br>A.G. Thaksala |
| **7.Welfare** | Find ways and means of assisting membership by developing new schemes.<br>Negotiate with Bank to extend welfare facilities enjoyed by the staff to Pensioners.<br>Organizing Medical Camps.,Negotiating with providers of medical services for discounts.<br>Plan and conduct suitable programs for development of members spiritual life. | M/s Q. Pathiranage – **Convenor**<br>G.G.D.G.de Silva – H.G.Nihal -<br>A.K.D. Guruge H.K.D.Hemantha<br>P.D.S. Liyanage, P.V. Leelarathne<br>A.G. Thaksala<br>M. Sukumaran – Invitee |
| **8. Office Management** | Disposal of unserviceable equipment/machines<br><br>Destruction of old documents. Streamline staff functions , salary revision, service contract. | M/s S.S. Perera – **Convenor**<br>P. Weerasinghe<br>Q.Pathiranage<br>A.G.Thaksala |
| **9. Death Donation Fund Revision-** | Prepare proposals on revision on Donations to be placed before the CC scheduled to be held in Nov/Dec 2025 based on the Actuarial Report/ Personal Data, and inflation | M/s. H.G. Nihal- **Conveno**r<br>M.F.S.W. Stembo – S.S.Perera<br>H.L.S. Silva |

Note:
President, General Secretary and the treasurer shall be ex- officio members of all sub- committees of the association.

**Medical Appeal Board** Represent Pensioners Medical Appeals with BOC General Secretary and M/s. Q.Pathiranage/S. Srilal Perera/A.G. Thaksala

**දිස්ත්‍රික් සම්බන්ධීකරණ නිලධාරීන්- District Co- Ordinators**

සංගමයේ බිම්මට්ටමේ ක්‍රියාකාරකම් වඩාත් විධිමත්ව සංවිධානය කිරීමේ හා එකී කටයුතුවලදී දිස්ත්‍රික් සංවිධාන හා මව් සංගමය අතර යහපත් සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාමේ අරමුණින් පහත දැක්වෙන සම්බන්ධීකරන නිලධාරීන් තෝරාපත්කර ගන්නා ලදී.

Under mentioned members were appointed to Organized and co- ordinate district level member activities with the main office.

**1.Central Province -** Kandy — Mr G. Bogaswatte - TP 0718254506
- Matale-Nuwara-Eliya — Mr Bandula Abeysekera - TP 0770301078

**2. Northern and Eastern Province** — Mr R. Ravindran - TP 0776006511

**3. North Western Province –** Kurunegala — Mr T.M. Thilakarathne - TP 0761589459
- Puttalam — Mr H.M. Mudiyanse - TP 0773823962

4. **North Central Province - Anuradhapura – Polonnaruwa** — Mr A.S.A. Wickremasinghe - TP 0718106450

**5.Southern Province-** Gall, Matara, Hambanthota- Mr P. V. Leelarathne - TP 0777044427

**6. Sabaragamuwa -** Ratnapura-Kegalle — Mr P.D.S. Liyanage - TP 0718241175

**7. Uva - Badulla- Moneragala** — Mr Gunapala Jagoda - TP 0718606333

**8.Western Province-** Colombo — Mr H.M. Abeysekera - TP 0712761720
- Gampaha — Mr H.K.D. Hemantha - TP 0771696808
- Kalutara — Mr A. Chandrapala - TP 0714201307

**මහනුවර දිස්ත්‍රික් සංවිධානයට එරෙහිව පවරා තිබූ නඩුව පැමිණිලිකරු විසින්ම ඉල්ලා අස්කර ගනී!**

ලංකා බැංකුවේ විශ්‍රාමිකයින් සංගමයේ මහනුවර දිස්ත්‍රික් සාමාජික කේ.එල්.හේමරත්න මහතා විසින් එකී දිස්ත්‍රික් සංගමයේ නිලධාරීන් හා කමිටු සාමාජිකයින් 18 දෙනෙකුට හා මව් සංගමයේ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව මහනුවර දිසා අධිකරණයේ 2024-06-06 දින පවරාතිබූ අංක 37/2024 නඩුව විවෘත අධිකරණයේදී ඉල්ලා අස්කර ගෙන ඇත.

1. 2023-03-17 දින පැවැති ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ මහනුවර දිස්ත්‍රික් සංවිධානයේ වාර්ෂික මහා සභා රැස්වීමේදී ගනු ලැබූ තීරණ ශූන්‍ය හා බල රහිත කරන ලෙසත්

2. එකී රැස්වීමේදී පත්කරගන්නා ලද නිලධාරී මණ්ඩලය ව්‍යවස්ථානුකූලව පත්වී නැතිහෙයින් ව්‍යවස්ථානුකූලව නැවත නිලධාරී මණ්ඩලයක් පත්කරන ලෙස අධිකරණ තීන්දුවක් ලබා දෙන ලෙසත්

3. දැනට පත්වී ඇති නිලධාරී මණ්ඩලයට සංගමයේ කටයුතු පවත්වාගෙන යාම තීරණ ගැනීම, මුදල් වියදම් කිරීම ආදී කටයුතුවල යෙදීම වලක්වාලමින් වාරණ නියෝගයක් ලබාදෙන ලෙසත්

පැමිණිලිකරු සිය පැමිණිල්ල මගින් ගරු අධිකරණයෙන් ඉල්ලා තිබුණි. නඩුව කැඳවූ මුල් අවස්ථා දෙකකදීම අධිකරණයේ පෙනී නොසිටි පැමිණිලිකරු 2025-04-29 දින නඩුව යලි කැඳවූ අවස්ථාවේ පෙනී සිට සිය පැමිණිල්ල විවෘත අධිකරණයේදී ඉල්ලා අස්කර ගනු ලැබීය.

අඩ සියවසකට ආසන්න කාලයක් පුරාවට ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ නිලතල හා වගකීම් භාරගනිමින් අපගේ සාමාජික සාමාජිකාවන් සංගමයේ මහා සාමාජිකත්වයේ උන්නතිය පතා නිස්සරණාධ්‍යාශයෙන් ඉටුකරනු ලබන ගෞරවනීය මෙහෙවර අවතක්සේරු නොකර තම තමාගේ ශක්ති ප්‍රමාණයෙන් දායකවෙමින් ඒවා වැඩිදියුණු කරමින් ඉදිරියට ගෙනයාමට එක්වන ලෙස සමස්ථ සාමාජිකත්වයෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

**අපේ නව නියමුවෝ**

- **ගරු සභාපති පීනදාස ගමගේ මයා.**



1973 ඔක්තෝම්බරයේ ලංකා බැංකුවේ සේවයට එක්වන පීනදාස ගමගේ මහතා සිය වෘත්තීය කටයුතුවල නිරතවෙන අතරම ඒ වෙනවිටත් තමා නිරත්වෙමින් සහ නීති අධ්‍යන කටයුතුවලද නොකඩවා නිරත විය.

1980 වසරේදී නීති නිලධාරයෙකු වශයෙන් ලංකා බැංකුවේ නීති අංශයට එක්වන ගමගේ මහතා 2011 වසරේදී ලංකා බැංකුවේ ප්‍රධාන නීති නිලධාරී තනතුරට උසස් කරනු ලැබීය.

2012 වසරේ විශ්‍රාම ලැබීමෙන් පසු කොළඹ දිස්ත්‍රික්කයේ හෝමාගම ප්‍රාදේශිකයේ ගරු සභාපති තනතුරත් අනතුරුව කොළඹ දිස්ත්‍රික්කයේ ගරු සභාපති තනතුරත් හෙබවූ හෙතෙම මව් සංගමයේ උප සභාපති ධුරය වසර ගණනාවක්ම දරා ඇත. ලංකා බැංකුවේ මාණ්ඩලික නිලධාරීන්ගේ සංගමයේ සභාපතිවරයා වශයෙන්ද කටයුතු කර ඇති ජිනදාස ගමගේ මහතා 2024 අප්‍රේල් 26වන දින පැවැති වාර්ෂික මහා සභා රැස්වීමේදී 2025/26 වසරේ නව සභාපතිවරයා ලෙස නිතරගයෙන් තෝරා පත් කර ගනු ලැබීය.

- <u>ගරු ප්‍රධාන ලේකම් වේලුපිල්ලේ රාජේන්ද්‍රන් මයා.</u>



ලංකා බැංකුවේ සමකාලීනයන් අතර රාජා නමින් චිරප්‍රසිද්ධ වී.රාජේන්ද්‍රන් මහතා මෙවර අප සංගමයේ ප්‍රධාන ලේකම් තනතුර සඳහා බහුතර ඡන්දයෙන් තෝරාපත් කර ගැනුනි.

මින් පෙරද සංගමයේ ගරු ප්‍රධාන ලේකම් තනතුර හොබවා ඇති රාජේන්ද්‍රන් මහතා සිය ගම්පෙදෙස වන අම්පිටිය සහ මහනුවර පාසල්වලින් අධ්‍යාපනය ලැබ ලංකා බැංකුවේ කණිෂ්ඨ ලිපිකරුවකු ලෙසින් සේවයට එක්වී 2007 වසරේදී ප්‍රධාන කළමනාකරුවෙකු ලෙස සේවය කරමින් සිටියදී විශ්‍රාම යන්නේ අවුරුදු 38ක බැංකු සේවාවකින් පසුවය. ලංකා බැංකුවේ විශ්‍රාම නඩත්තු අංශයේ ආරම්භයේ සිටම සේවය කළ රාජා බැංකුවේ විදේශ අංශයේත්, යෝර්ක් වීදිය ශාඛාවේ සහ මහනුවර, මාතලේ,නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි විවිධ ශාඛාවන්වලත් සේවය කර ඇත.

1989 වසරේ බැංකුවේ ක්‍රියාත්මක කල ප්‍රතිසංවිධාන ව්‍යාපෘතියේ (Re- Organization Project) කළමනාකාරවරයෙකු වශයෙන් කටයුතු කල රාජේන්ද්‍රන් මහතා එමගින් දිවයින පුරා ශාඛා සහ පලාත් කාර්යාලයන්ට සිය සේවා දායකත්වය ලබා දුනි.

රාජේන්ද්‍රන් මහතා වරලත් මූල්‍ය සේවා ආයතනය ලෙසින්ද හැඳින්වෙන ලංඩනයේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන අතර 2003/2006 වසරවල එම ආයතනයේ ලාංකීය සංවිධානයේ මහලේකම් තනතුර දැරීය.

1972- දින 108දී වැඩවැරුමට සක්‍රීයව දායකවූ රාජා 2000/2007 කාලපරිච්ඡේදයේදී ලංකා බැංකුවේ නිලධාරීන්ගේ සංගමයේ ඉදිරිපෙළ ක්‍රියාධරයෙකු ලෙස ප්‍රධාන තනතුරු දරමින් සාමාජිකත්වයට අගනා සේවයක් ඉටු කළේය.

2007 විශ්‍රාමයාමෙන් පසු දෙහිවල ප්‍රාදේශිකය හරහා විශ්‍රාමිකයන්ගේ සංගමයේ කටයුතුවලට එක්වන රාජේන්ද්‍රන් මහතා 2018/19 වසරේ මව් සංගමයේ උප භාණ්ඩාගාරික ලෙසත්, 2019/20 වසරේ උප ලේකම් ලෙසත්, 2020/23 ප්‍රධාන ලේකම් ලෙසත් ප්‍රශංසනීය සේවාවක් ඉටු කොට ඇත.

- <u>ගරු භාණ්ඩාගාරික ලලිත සුනිල් සිල්වා මයා.</u>



1974 ජූනි 03 දින ලංකා බැංකුවේ මීගමු ශාඛාවේ කාර්ය මණ්ඩලයට එක්වෙමින් බැංකු සේවය ආරම්භ කල ලලිත සුනිල් සිල්වා මහතා දැදිගම , දංකොටුව, කිරිබත්ගොඩ, කටුනායක ආදී ශාඛාවන්හිත් බස්නාහිර පලාත් කාර්යාලය ජාත්‍යන්තර අංශය හා පරීක්ෂණක අංශයෙත් දීර්ඝ සේවාවකින් පසු 2009 විශ්‍රාම ලැබීය.

අපගේ ගම්පහ දිස්ත්‍රික් සංවිධානයේ ප්‍රධාන ලේකම් තනතුර දැරූ ලලිත් ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ මරණාධාර අරමුදලේ ප්‍රධාන භාණ්ඩාගාරික වශයෙන්ද සේවය කොට ඇත. 2025/26 නව වසර සඳහා සංගමයේ ප්‍රධාන භාණ්ඩාගාරික ධුරය සඳහා ලලිත සුනිල් සිල්වා මහතා නිතරගයෙන් තේරී පත්විය.

<u>හුදකලාව පරදවමු!</u>

2024 වසරේදී ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය සිය හතලිස් පස්වන සංවත්සරය සමරන ලදී!

එවන් අභිමානවත් සංගමයක හතලිස් හය වැනි සභාපතිවරයා වශයෙන් මා නීතරගයෙන් පත්කර ගැනීම සම්බන්ධව සමස්ථ සාමාජිකත්වයට මාගේ ගෞරවනීය ස්තූති පුද කිරීමට මෙය අවස්ථාව කර ගනිමි. මේ දක්වා අප සංගමයේ කටයුතු ඉතා යහපත් ලෙස පවත්වා ගෙන ආ සංගමයේ ක්‍රියාධරයන් සියළුදෙනාටද මාගේ ගෞරවනීය ආචාරය පුදකර සිටිමි. මේ වන විට අප සංගමය විශ්‍රාමික සාමාජික සාමාජිකාවන් 7050 දෙනෙකුගෙන් හා වැන්දඹු හා අනන්දරූ සාමාජික සාමාජිකාවන් 2016 දෙනෙකුගෙන්ද සැදුම් ලබයි. අප බැංකුවේ සේවය කල මහා කළමනාකාර ශ්‍රේණියේ සිට බැංකු සේවයේ සියළුම ශ්‍රේණීන් හා ධාරාවන් නියෝජනය කළ කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් හා ඔවුන්ගේ මරණයෙන් පසු වැන්දඹු අනන්දරූ සාමාජිකත්වය ලැබූ කලත්‍රයන්ගෙනුත් සමන්විත අපගේ මහා සාමාජිකත්වය දැඩි විවිධත්වයකින් යුතු එකමුතුවකි. මෙහිදී අප සෑම එකට බැඳ තබන පොදු තත්වය නම් " විශ්‍රාමික" නාමයෙන් හැඳින්වෙමින් අප ගෙවමින් සිටින අපගේ ජීවිතවල අවසාන භාගයයි.

විශ්‍රාමයෙන් පසු යම් ස්වාධීනත්වයකින් යුතුව අපගේ දිවි පැවැත්ම පවත්වාගෙන යාමට මාසික විශ්‍රාම වැටුපක් බැංකුවෙන් ගෙවනු ලබන අතර අප විසින් දරනු ලබන වෛද්‍ය වියදම් යම් සීමාවන්ට යටත්ව ප්‍රතිපූර්ණය කර ගැනීමේ හැකියාවද පවතී. අප සේවයේ යෙදීසිටි තුරුණුවියේදී මෙන් නොව විශ්‍රාම දිවිය ගත කරන- වියපත් වියේදී වැඩිපුර වෛද්‍ය වියදම් දැරීමට සිදුවීම ස්වාභාවිකය. විශ්‍රාමිකයන් සඳහා දනට ගෙවනු ලබන වෛද්‍යාධාර ප්‍රමාණවත් නොවන බැවින් 2010 වසරේ බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කල

තීරණයන් අනුව යමින් සක්‍රිය සේවයේ නියතු කාර්ය මණ්ඩලයට ගෙවනු ලබන වෛද්‍යාධාර එලෙසින්ම විශ්‍රාමිකයන් සඳහාද ගෙවන ලෙස පසු ගිය කාලය පුරාම සංගමය විසින් කරනු ලබන ඉල්ලීම මේ වනවිටත් ඉටුවී නොමැත. එම ඉල්ලීමද ඇතුළු සාමාජික අයිතිවාසිකම් දිනාගැනීමේ අරමුණෙන් සංගමය සිය ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කරනු ඇත.

සාමාජික අයිතිවාසිකම් දිනාගැනීමේ ක්‍රියාමාර්ගයන්ට අතිරේකව- සාමාජික සුභ සාධනය වර්ධනය කිරීමේ කටයුතු සඳහා අප යොමුවිය යුතු කාලය එළැඹ තිබේ.

අපද ඇතුළුව- ලෝක වැඩිහිටි ප්‍රජාව මුහුණදෙන ගැටළු අතර එක් ප්‍රධාන ගැටළුවක් වන්නේ හුදෙකලාවීම නැතහොත් මහළුවියේ තනිවීමයි. (Loneliness) සිය ලබැඳියන්ගෙන් ඈත්වීමට සිදුවීම මෙහි මූලික හේතුවයි. තම සහකරුවන්ගෙන්/ සහකාරියන්ගෙන් මෙන්ම දු දරු නෑදෑ හිතමිතුරන්ගෙන් දුරස්වීමට හේතුවන, විවිධාකාර හේතුන් මෙන්ම පරම්පරාවන් අතර ඇතිවන වෙනස්කම්- සමාජ වටිනාකම්වල මෙන්ම තාක්ෂණයේ සිදුවන අනවරත වෙනස්කම් ආදියද මෙම තනිවීම කරා බෙහෙවින් බලපානු ලබයි. අප මුහුණදෙමින් සිටින පෞද්ගලික තත්වයන්, ලෙඩදුක් මෙන්ම ලබැදියන් විදෙස්ගතවීම ආදිය මෙම තනිකම වඩාත් තීව්‍රකරන කරුණු විය හැක. සමහර කෙනෙක් තම පවුලේ අය සමග සුපුරුදු වාසස්ථානයේ ජීවත්වෙමින් සිටියදීම ඒ කුටුම්බය තුළම තනිවිය හැකිය.

තනිකම පිළිබඳව මෑතකදී කරන ලද පර්යේෂණවලින් හෙලිවී ඇත්තේ තනිකම නිසා කෙනෙකුගේ ජීවිත අවධානම 39%කින් වැඩිවිය හැකිබවයි. මෙහි වඩාත් ඛේදනීය තත්වය වන්නේ තනිව ජීවත්වීම නිසා මේ තත්වය 77% දක්වා වැඩිවිය හැකිවීමයි. එමෙන්ම ලෝක ජනගහනයෙන් සමස්ථයක් වශයෙන් ගත්කල 33%ක් තනිකමින් පෙළේ. ලාංකීය සමාජ රටාව තුළ මෙම අගයන් මෙයට වඩා පහළ අගයක් ගත හැකි වුවත් ඉදිරියේදී ඒවායේ ඉහළයාමේ අවදානමක්ද නැතුවා නොවේ.

අපගේ සාමාජිකයන්ද එකසේ මුහුණදෙන මෙම තනිකම පිළිබද ප්‍රශ්නයට යම් සහනශීලී විසඳුම් හොයායාම සඳහා අපට කාලය එළැඹ ඇත. මේ පිළිබද මව් සංගමයට මෙන්ම දිස්ත්‍රික් හා කලාප සංගම්වලටද සමස්ථ සාමාජිකත්වයටද ඇත්තේ අත්හල නොහැකි වගකීමකි.

**ජිනදාස ගමගේ - ගරු සභාපති**

## අසීරුතාවන්ට මුහුණදෙන සාමාජිකයින්ට පිහිටුවමු!

මේ වනවිට අපගේ සාමාජික සාමාජිකාවන්ගෙන් සාතිශය බහුතරය සිය 75වන උපන්දිනයද පසුකර සිටී! ඔවුන් වෙත අප අපගේ උණුසුම් සුභ පැතුම් එක් කරමු.
විවිධ රෝගීතත්වයන් මහළුවියේ අබල දුබලකම් මෙන්ම මගහැර යා නොහැකි "තනිකම" නිසාවෙන්ද ශාරීරිකව හා මානසිකව අසහනයට පත්වන සාමාජික සංඛ්‍යා දිනෙන් දින වර්ධනය වෙමින් පවතී. මේ තත්වයයන්ට යම් හෝ සහනයක් වියහැකි වැඩපිලිවෙලත් සකස්කර ක්‍රියාවට නැංවීමට මේ වනවිටත් සංගමයේ සුභ සාධක අනු කමිටුව ක්‍රියා කරමින් සිටී.

## සංගම් නායකත්වය ලංකා බැංකුවේ සභාපතිතුමා මුණගැසේ

ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ නව නායකත්වයේ ප්‍රධානීන් 2025-06-13 දින ලංකා බැංකුවේ සභාපති කාවින්ද ද සොයිසා මහතා එතුමාගේ කාර්යාලයේදී මුණගැසිනි. මෙම සුහදහමුවට ලංකා බැංකුවේ මහා කළමනාකාර රසල් ෆොන්සේකා මහතා සහ මානව සම්පත් නියෝජ්‍යය මහා කළමනාකාර ධම්ම විජේවර්ධන මහතාද එක්විය.



## Meeting with the Chairman BOC

Key officials of the new committee of management paid a courtesy call on chairman Bank of Ceylon Mr. Kavinda De Zoysa on 13th June 2025 at BOC Head Office. General manager BOC Mr. W.P.Russel Fonseka & Deputy General Manager HR Mr. Dhamma Wijayawardana also attended to the occasion.

## සංගමයේ නායක දෙපලක් දිවියෙන් සමුගනී!

- කේ.ටී.කරුණාරත්න මහතා



නෙක නෙක ලෙසට පහන් ටැඹ තුල බැබුලු වුන
එක එක පහන්සිළු නිවෙනව දිනෙන් දින
අටලෝ දහම සිටියත් මම සිතට ගෙන
මේ වැනි දුකක් දැනුනේ නැත කලින් වෙන
(ජගත් කුරුදු කුඹුර මහතාගේ ශෝක ප්‍රකාශනයකින්)

ජයවර්ධනපුර සරසවියේ වාණිජවේදී ගෞරව උපාධිය නිමකර (1981) වසරේ පෙබරවාරි මස කළමනාකාර පුහුණුවන්නෙකු වශයෙන් ලංකා බැංකුවට එක්වූ කේ.ටී.කරුණාරත්න මහතා, පුහුණුවෙන් පසු බැංකුවේ ගිරාදුරු කෝට්ටේ වැනි දුෂ්කර පළාත්වල සේවය කරමින් ග්‍රමීය ජනතාවට ගොවිණය ආදිය සපයමින් බැංකු සේවාවට එහා ගිය සේවයක් ඉටු කරන ලදී.

පසුව කොළඹ අළුත්කඩේ, වැල්ලවත්ත ආදී ශාඛාවල කළමණාකාර තනතුර හොබවමින් නාගරික ජනතාවට ප්‍රසංසනීය බැංකු සේවාවක් ඉටු කරන ලදී. 5S සංකල්පය යොදාගනිමින් වැල්ලවත්ත ශාඛාව නවීනත්වයට පත් කරන ලද්දේද එතුමාය.

නැගෙනහිර පළාත භාර සහකාර මහා කළමණාකාර ධූරය හා මධ්‍යම පසුපොළ කාර්යාලය භාර සහකාර මහා කළමනාකාර ධූරයද හොබවන ලද කරුණාරත්න මහතා ලංකා බැංකුවේ කාර්යයන් පරිගණක ගත කිරීමේ කටයුත්තේදී මහත් මෙහෙයක් ඉටුකළේය. එසේම එතුමා බැංකුවේ උගස් කටයුතු, සාමාන්‍ය බැංකු කටයුතු, නිෂ්කාශන කටයුතු ආදිය පිළිබඳව පුහුණුකරුවෙකු ලෙස බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ කටයුතුවලටද සහභාගී විය.

අවුරුදු 34ක් පුරා ලංකා බැංකුවේ විවිධ අංශවල කැපී පෙනෙන සේවයක් කල කරුණාරත්න මහතා (2015) වසරේ අගෝස්තු මස බැංකු සේවයෙන් විශ්‍රාම ගන්නා ලදී.

විශ්‍රාම ගැනීමෙන් පසුව එතුමාගේ සුපුරුදු නායකත්ව දක්ෂතා ප්‍රදර්ශනය කරමින් ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ ගම්පහ දිස්ත්‍රික් ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු හොබවමින් සංගමයට විශාල සේවයක් කරන ලදී. එතුමා වසර කීපයක්ම විශ්‍රාමිකයින්ගේ මරණාධාර සංගමයේ සභාපති තනතුර හොබවමින් මනා මූල්‍ය කළමණාකරනයක් හඳුන්වාදීම මඟින් අරමුදල් වාසිදායක ලෙස ආයෝජනයකර සංගමය සතු මූල්‍ය සම්පත් වැඩි දියුණු කර සාමාජිකයන්ගේ මරණාධාර දීමනා වැඩි කිරීමටද කටයුතු කරන ලදී.

එසේම බැංකු සේවකයන්ගේ විනය පරීක්ෂණ සඳහා එතුමා බැංකුවේ කළමණාකාරිත්වයට විශේෂ සහායක් දැක්විය.

වසර කීපයක් කැළණිය කලාපයේ සභාපති වශයෙන් කටයුතු කරමින් විවිධ සමාජීය සහ පුණ්‍ය වැඩ සටහන් සාර්ථකව නිමකරමින් මනා ආදර්ශයක් ලබාදෙන ලදී

එමෙන්ම ඉතා දුශ්කර පලාත්වල පිහිටි පන්සල් වැඩි දියුණු කිරීමේ කටයුතු සදහාද ස්වෙච්ඡාවෙන් සිය ධනය,ශ්‍රමය හා කාලය කැප කළ කරුණාරත්න මහතා 2025 අප්‍රේල් මාසයේ අභාවප්‍රාප්තවිය. එතුමාට නිවන් සුව පතමු!

- ගාමිණී ජයරත්න මහතා (1957-2025)



1982 සැප්තැම්බර් 15 දින කණිෂ්ඨ ලිපිකරුවෙකු වශයෙන් ලංකා බැංකුවේ සේවයට බැදී 2017 නොවැම්බර් 15 දින ජ්‍යේෂ්ඨ කළමනාකාරවරයෙකු වශයෙන් පී.ඩී.පී.ජයරත්න මහතා විශ්‍රාම ලැබීය. ඒ අවුරුදු 35කුත් මාස හතරක දීර්ඝ සේවා කාලයකින් පසුවය.

ලංකා බැංකුවේ ප්‍රධාන කාර්යාලයය යෝර්ක් වීදියේ සිට ඇව්ලන් චතුරශ්‍රයේ ඉදිකළ නව ගොඩනැගිල්ලේ ප්‍රතිෂ්ඨාපනය කල 82 වසරේම මුලින්ම එහි ප්‍රවිශ්ඨවූ ආයතනික ශාඛාවේ කාර්ය මණ්ඩලයට එක්වූ ගාමිණී සුළු කලෙකින්ම සිය කාර්යමණ්ඩලය තුලත්- කළමනාකාරිත්වයේ මෙන්ම ගනුදෙණුකාර සාමාජයේත් සිත් දිනාගත් ජනප්‍රිය පුද්ගලයෙකු බවට පත්විය. සිය වෘත්තීය කටයුතු ඉහළ ප්‍රමුඛතාවයකින් ඉටු කළ ජයරත්න වෘත්තීය සමිති කටයුතු මෙන්ම සාමාජ සේවා කටයුතුකෙරේද දැඩි උනන්දුවකින් සහභාගී විය. එමෙන්ම වෘත්තිය අධ්‍යාපන කටයුතුවල මෙන්ම ශාස්ත්‍රීය අධ්‍යාපන කටයුතුවලද කැපවීමෙන් නියුතුවිය.
ආයතනික ශාඛාවට සමුදෙන ගාමිණී පසුව සිය උපන්බිමවූ සබරගමුව සේවා ස්ථානය ලෙස තෝරා ගනී. සබරගමු පළාත් කාර්යාලය කේන්ද්‍ර කොටගෙන පළාතේ විවිධ ශාඛා හා දෙපාර්තමේන්තුවල සේවය කල ගාමිණී කලක් ලංකා බැංකුව නිවිතිගල ශාඛාවේ කළමනාකාරවරයා වශයෙන්ද සේවය කළේය. සිය විශ්‍රාම වයස වෙද්දී ගාමිණී ලංකා බැංකුවේ සබරගමු පළාත් කාර්යාලයේ ජ්‍යේෂ්ඨ කළමනාකාරවරයා විය.

විශ්‍රාම ගැනීමෙන් පසු ලංකා බැංකුවේ විශ්‍රාමික සංගමය හා එක්වන ගාමිණී විශේෂයෙන් අපගේ රත්නපුර දිස්ත්‍රික් සංවිධානයේ ජනප්‍රිය නායකයකු බවට පත්විය. ගතවූ වසර අටක කාලයතුල විවිධ නිලතල හොබවමින් විශ්‍රාමික සාමාජිකත්වයට මහගු සේවායක්

ඉටු කළ ගාමිණී මියයනවිට දිස්ත්‍රික් සංවිධානයේ සභාපති තනතුර මෙන්ම මව් සංගමයේ විධායක කමිටු සාමාජිකත්වයද දරමින් සිටියේය.
2024 වසරට යෙදුනු ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමයේ 45වන සංවත්සර සැමරුම වෙනුවෙන් ගාමිණීගේ නායකත්වයෙන් සංවිධානය කෙරුණ රත්නපුර සංවත්සර සැමරුම් වැඩ සටහන විශේෂයෙන් කැපී පෙනුනි. මව් සංගමයේ මෙහෙයවීමෙන් අනුරාධපුරයේ දෙදිනක්පුරා පැවැති සර්වාගමික සැමරුම් මෙහෙයන් සාර්ථක කරගැනීමටද රත්නපුර දිස්ත්‍රික්කය නියෝජනය කරමින් ඔහු ඉටුකල කාර්යභාර්ය ප්‍රසංසනීයවේ.

2025 අප්‍රේල් 24 දින අනපේක්ෂිත රෝගාබාධයක් හේතුවෙන් නොකල්හි සිය ප්‍රිය  බිරිඳ සුනිතාත් දෙටුපුත් සුධීර හා දියණිය අමන්දාත් ඇතුළු සිය ආදරණීය කැදැල්ල මෙන්ම ලංකා බැංකුවේ විශ්‍රාමික සංගමයේ රත්නපුර දිස්ත්‍රික් සංවිධානය මෙන්ම එහි මව් සංගමය හැරයාමෙන් ගාමිණී ජයරත්නයන් ඇතිකළ හිදැස කිසිදා නොපිරවිය හැක්කකි.

ගාමිණීගේ බිරිඳ සුජතා වසර හතලියක ගුරු සේවාවෙන් විශ්‍රාමගෙන සිටින අතර වෛද්‍යවරයෙකු වන පුත් සුධීර පුතණුවන් ඔස්ට්‍රේලියාවෙත්- කතිකාචාර්යවරියක වන දියණිය අමන්දා අනුරාධපුරයේත් සේවයකරමින් සිටී.
ප්‍රිය ගාමිණී- ඔබට සුභ ගමන්!

**<u>අපේ වෙබ් පිටුව පරිහරණය කරමු.</u>**

ලංකා බැංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය සාමාජිකත්වයේ තොරතුරු සන්නිවේදනය වඩා කඩිනම් හා විධිමත් තලයකට ගෙන ඒමේ අරමුණකින් වෙබ් අවකාශයත් නිර්මාණය කර පවත්වාගෙනයයි. **www.bocpenasso.com** ලිපිනය හරහා එය පරිහරණය කිරීමෙන් යාවත්කාලීන කරනු ලබන සංගමයේ තොරතුරුමෙන්ම සමාජිකයින් සම්බන්ධයෙන් වන විශේෂ තොරතුරුවලට ප්‍රවේශවීමටත් පොදුවේ සාමාජිකයන්ට අවශ්‍ය වියහැකි අකෘතිය පත්‍ර ආදිය බාගත කර ගැනීමටත් පුළුවන.
එමෙන්ම සාමාජිකයින්ගේ නිර්මාණ, ඡායාරූප, හා කණ්ඩායම් තොරතුරු සංගමයේ ප්‍රධාන ලේකම්වරයාට යොමු කිරීම මඟින් මෙම වෙබ් අවකාශයේ පල කරවා ගැනීමේ හැකියාවද පවතී. ඔබේ වෙබ් පිටුව වැඩි වැඩියෙන් පරිහරණය කරන්න. දියුණු කිරීමට අවශ්‍ය යෝජනා වෙතොත් ලේකම්වරයාට යොමුකරන්න.

-ප්‍රධාන ලේකම්-
Tel: 077-3114478
Office WhatsApp Number: 071-2433592

ලංකා බංකුවේ විශ්‍රාමිකයින්ගේ සංගමය,
ලංකා බැංකුව, නගර ශාඛාව ගොඩනැගිල්ල,
පළමුවන මහල,
අංක 41,
ශ්‍රීමත් රසික් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය),
කොළඹ 01,